මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission

මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක : **LAE/2023/58** **2024.10.02**

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2023 පැවැත්වීම සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ නිවේදනය.

2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව ගොනු කොට තිබූ මූලික අයිතිවාසිකම් අයදුම්පත් සම්බන්ධයෙන් 2024.08.22 දින ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදුන් තීන්දුව මැතිවරණ කොමිෂන් සභාව විසින් නිසි ගෞරවයෙන් යුතුව සැලකිල්ලට ගන්නා ලදී.

එසේම 2024 ජූලි මස 26 වන දින ප්‍රකාශයට පත් කරන ලද අති විශෙෂ ගැසට් නිවේදනය අනුව 2024 සැප්තැම්බර් මස 21 වන දින ජනාධිපතිවරණය පැවැත්වීමට අදාළ කටයුතු ඒ වන විටත් සිදු කෙරෙමින් පැවතීම හේතුවෙන් ජනාධිපතිවරණ ඡන්ද විමසීම අවසන් වූ වහාම පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පැවැත්වීමට කොමිෂන් සභාව අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී. මේ පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2024.08.28 දිනැතිව මාධ්‍ය නිවේදන අංක LAE/2023/57 නිකුත් කොට ඇත.

තවද, පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ කටයුතු සංවිධානය කිරීම පිළිබඳව දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් සමඟ හා රජයේ මුද්‍රණාලය ඇතුළු සෙසු රාජ්‍ය ආයතන සමඟ ද සාකච්ඡා කිරීමෙන් අනතුරුව ඒ සඳහා අවම වශයෙන් දින 30- 35 ක් අතර දක්වා වූ කාලයක් අවශ්‍ය වන බැව් නිරීක්ෂණය කරන ලදී.

2024.09.21 දින පැවති ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමෙන් තේරීපත් වූ ජනාධිපතිවරයා විසින් 2024.09.24 වන දින පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ හා පාර්ලිමේන්තු මැතිවරණය සඳහා දින නියම කිරීමේ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී. එබැවින් රටේ ව්‍යවස්ථාදායකයට නියෝජිතයින් තෝරා පත්කර ගැනීමේ කාර්යය සඳහා ප්‍රමුඛත්වය දී ක්‍රියා කිරීමට මැතිවරණ කොමිෂන් සභාවට සිදු වී ඇත. එසේම ජනාධිපතිවරණ ඡන්ද විමසීම් කාලසීමාව තුළ දී තීරණය කළ පරිදි පාර්ලිමේන්තු මැතිවරණය අතරතුර එනම් 2024.10.26 දින ඇල්පිටිය ප්‍රාදේශිය සභා ඡන්ද විමසීම පැවැත්වීමට ද සිදු වී ඇත.

ශ්‍රී ලාංකික ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සුරැකීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව සිය කාර්යභාරය මැනවින් වටහාගෙන කටයුතු කරනු ලබන අතර 2024 අගෝස්තු 22 වන දින ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදුන් නියෝගයට අනුකූලවෙමින් නීතියෙන් නියම කර ඇති මැතිවරණ පැවැත්වීමේ කාර්යභාරය ද සැලකිල්ලට ගනිමින් පාර්ලිමේන්තු මැතිවරණයේ කටයුතු අවසන් වූ වහාම කොමිෂන් සභාව විසින් හැකි ඉක්මනින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පැවැත්වීමට දින නියම කිරීමට කටයුතු කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**ආර්.එම්.ඒ.එල්.රත්නායක**
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි)